# ව්‍යාපාර පසුබිම - ඇල්මැති පාර්ශව

01. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව යන අය නිර්වචනය කරන්න.

02. කල්‍යාණි මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් ගුරුභවතුන්ගේ, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා සිසු දෙමාපියන්ගේ සෞඛ්‍ය කටයුතු වර්ධනය සඳහා වෛද්‍ය සායනයක් පවත්වන ලදී.

   I. ඉහත ප්‍රකාශයට අනුව පාසලට, ඇල්මැති පාර්ශව තුනක් නම් කරන්න.

   II. ඔබ ඉහත නම් කරන ලද පාර්ශව පාසල කෙරෙහි දායකත්වය ලබාදෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

03. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

   I. රැකියා උත්පාදනය ව්‍යාපාරයක සේවකයින් නැමැති ඇල්මැති පාර්ශවයේ අරමුණකි.

   II. ව්‍යාපාරවලට අවශ්‍ය අරමුදල් යොදමින් එහි අවදානම් දරමින් එහි ප්‍රතිලාභ භුක්ති විඳින පුද්ගලයින් හිමිකරුවන් වේ.

   III. නිසි පරිදි මුදල් ලබා ගැනීම ව්‍යාපාර ඇල්මැති පාර්ශවයක් වන සැපයුම්කරුවන්ගේ අරමුණකි.

   IV. පරිසරයට හිතකර ව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන්නේ දැයි විමසා බැලීම තරගකරුවන් සතු අරමුණකි.

04. කල්‍යාණි මහා විද්‍යාලයේ සිසුන්ගේ කීඩා කුසලතාව වර්ධනය කිරීමේ අරමුණින් 2020 වර්ෂයේ මෙම විද්‍යාලයේ පැවති නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ දී පාසලේ විදහල්පතිගේ හා ගුරුමණ්ඩලයේ ඉල්ලීම පරිදි කිතුල්ගල නගරයේ ප්‍රසිද්ධ ව්‍යාපාරයක් වන "දයා සමුහ ව්‍යාපාරයේ" මූල්‍ය අනුග්‍රය ඇතිව, ක්‍රීඩා තරගවලට ඉදිරිපත්වන දරුවන්ගේ සියලු ප්‍රථමාධාර කටයුතු සඳහා සියලු පහසුකම් සහිත කුටියක් ක්‍රීඩා භූමිය තුළ ඉදි කරන ලදී.

   I. ඉහත සිද්ධිය ඇසුරින් හඳුනා ගත හැකි මිනිස් අවශ්‍යතා දෙකක් හා ඒවා සපුරා ගන්නා ආකාරය ලියන්න.

   II. ඉහත සිද්ධියට අනුව දයා සමුහ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව 3 ක් නම් කරන්න.

   III. ඉහත ii ප්‍රශ්ණයට පිළිතුරු ලෙස ඔබ සඳහන් කරන ලද පාර්ශව තුන වෙතින් ව්‍යාපාරය අපේක්ෂා කරන දායකත්වන් වෙන වෙනම සඳහන් කරන්න.